දරුවන් උදෙසා
බයිබලයක්

# ජේසුස් වහන්සේ මුහුදේ කුණාටුව නිශ්චල කරන සේක



ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Janie Forest
Alastair Paterson

සකස්කරන්නා: Ruth Klassen

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර
ඇතිමුත් එය විකිණීමට අවසර නැත.



ජේසුස් වහන්සේ සහ
උන්වහන්සේගේ
ගෝලයෝ
බෝට්ටුවක
සිටියෝය. විශාල
කුණාටුවක් ඇතිවිය.
එය ගලීල මුහුද
දරුණු තත්වයකට
පත් කළේය. මේ
ආකාරයේ
කුණාටුවක්, නැව්
කැඩී හා ගිලී යාමට
පවා හේතු විය
හැකිය.

කුණාටුව නිසා ශ්‍රාවකයෝ බියට පත් වූවෝය. මුහුදු රළ බෝට්ටුව වතුරෙන් පුරවා දැමීය. නමුත් යේසුස් වහන්සේ ඔරුවේ නිදා සිටිසේක. කුණාටුව මැදදීත් උන්වහන්සේ නිදාසිටි සේක. ගෝලයෝ ජේසුස් වහන්සේ



අවදි කර, “ගුරුතුමනි, ගුරුතුමනි, අපි විනාශ වෙනවායැ” යි කීවෝය.

“ඔබ බියවන්නේ මන්ද? ඔබට ඇදහිල්ල මදියැ” යි ජේසුස් වහන්සේ ගෝලයන්ට කීසේක. ඉන්පසු උන්වහන්සේ සුළඟට නවතින ලෙස ඊට අණ කළ සේක. එලෙසින්ම ජේසුස් වහන්සේ ඉහළ නඟින රළට නිශ්චල වන්නට අණ කළ සේක.



සුළඟේ සැර අඩුවිය. මුහුද නිශ්චල විය. “සුළඟත් මුහුදත් පවා කීකරු වන මොහු කවරෙක් විය හැකිදැ” යි කියා ශ්‍රාවකයෝ පුදුම වූවෝය.



ටික දවසකට පසු ජේසුස් වහන්සේට තවත් කාර්යබහුල දවසක් උදාවිය. 5000 කට අධික පිරිසක් උන්වහන්සේ පසුපස පාළු ස්ථානයකට පැමිණ සිටියෝය. දෙවියන් වහන්සේගේ බලයෙන් ජේසුස් වහන්සේ ඒ මුළු සෙනඟම පෝෂණය කළේ එක කුඩා දරුවෙකුගේ දිවා ආහාරය පමණක් යොදා ගනිමිනි. සවස් විය. ජේසුස් වහන්සේ සියලුදෙනාම පිටත් කර හැරිය සේක.



ශ්‍රාවකයින්ට පවා පිටව යාමට සිදු විය. ජේසුස් වහන්සේ ඔවුන්ව ඔරුවට නංවා තමන්වහන්සේට කලින් ගලීල මුහුදෙන් එගොඩට යන්න සැලැස්වූ සේක.





ජේසුස් වහන්සේ
සියලු දෙනා පිටත්
කර හැරිය පසු
යාච්ඤා කිරීම සඳහා
තනිවම කන්දකට
නැඟි සේක. සවස් වූ
විට උන්වහන්සේ එහි
තනිව සිටි සේක.



විල මතදී ශ්‍රාවකයෝ
සුළි කුණාටුවකට හසු
වූවෝය. පැය ගණන්
ඔරුව පැද ගියත්
කුණාටුව ඔවුන්ව
ජලයෙන් එතෙර වීම
නතර කළේය.
ගෝලයන්
නොදැන
සිටියත් ඔවුන්
බොහෝ සේ
පුදුම වන
දෙයක්
සිදුවෙමින්
පැවතුණි.



අලුයම තුනත් හයත් අතර කාලයෙහි, ඒ ශ්‍රාවකයෝ තද සුළං සහිත මුහුද මැද නැතිගැන්වෙන සුළු යමක් දුටුවෝය. “ඒ අවතාරයක්!” ඔවුහු කෑගැසුවෝය. එහෙත් ඒ ඔවුන්ගේ ස්වාමින් වූද ගුරුවරයාණන් වූද ජේසුස් වහන්සේ වූ සේක. උන්වහන්සේ ජලය මත ඇවිදිමින් ඔවුන් වෙතට පැමිණි සේක.

"සන්තෝෂ වන්න!" ජේසුස් වහන්සේ ඔවුන් ඇමතූ සේක. "මේ මමය, බිය නොවන්න." පේතෘස් පිළිතුරු දෙමින්, "ස්වාමීනි, ඒ ඔබ නම්, වතුර මත ඔබවහන්සේ වෙතට එන්නට මට අණ කළ මැනවැ" යි කීවේය. එබැවින් ජේසුස් වහන්සේ, "එන්න" යයි කී සේක. පේතෘස් නිර්භීතව බෝට්ටුවෙන් වතුරට බැස ජේසුස් වහන්සේ වෙතට ඇවිද ගියේය.





නමුත් කැරකෙන
සුළඟ දුටු විට
පේතෘස් බියට පත් වී
ගිලෙන්නට පටන්
ගත්තේය. “ස්වාමීනි,
මාව බේරගන්න!”
ඔහු කෑගැසුවේය.

එකෙණෙහිම, ජේසුස් වහන්සේ තම
අත දිගු කර පේතෘස් අල්ලා ගත්සේක.
"අහෝ මඳ ඇදහිල්ල ඇති තැනැත්ත,
ඇයි ඔබ සැක කළේ?" උන්වහන්සේ
ඇසූ සේක. පේතෘස් සහ ස්වාමීන්
වහන්සේ ඔරුවට නැඟුණෝය. සුළඟ
නතර විය.





එවිට ඔරුව තුල වුන්
සියල්ලෝ ජේසුස්
වහන්සේට නමස්කාර
කරමින් “සැබවින්ම ඔබ
දෙවියන් වහන්සේගේ
පුත්රයායැ” යි කීවෝය.

ජේසුස් වහන්සේ මුහුදේ කුණාටුව නිශ්චල කරන සේක

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. මතෙව් 8, ශු. මතෙව් 14, ශු. මාක් 4, ශු. ලූක් 8

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය** 119:130

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)